[redacted] පරිපාලන චක්‍රලේඛ අංක: 381

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1987.09.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**1987 ජුලි 28 දින සිට 1987 අගෝස්තු 12 දින දක්වා කාලය තුල ඇතිවූ කලබල නිසා දේපලවලට හානි සිදුවූ සහ/හෝ චංචල දේපල අහිමි වූ රජයේ නිලධරයන්ට හා රාජ්‍ය සංස්ථා සේවකයන්ට මැටුප් අත්තිකාරම්.**

1987 ජුලි මස 28 වෙනි දින සිට 1987 අගෝස්තු මස 12 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය තුල ඇතිවූ කලබල හේතුකොට ගෙන ස්වකීය නිශ්චල දේපලවලට හානි සිදුවූ සහ/හෝ චංචල දේපල අහිමි වූ රජයේ නිලධරයකු, සංස්ථා සේවකයකු සඳහා හෝ කලත්‍රයන් දෙදෙනාම රජයේ නිලධරයන් හෝ සංස්ථා සේවකයන් වනු විට ඒ එක් එක් අයට වෙන වෙනම හෝ කලත්‍රයන්ගෙන් එක් අයෙක් රජයේ නිලධරයෙකු හා අනෙක් අය සංස්ථා සේවකයකු වන විට ඒ එක් එක් අයට වෙන වෙනම හෝ 1985 නොවැම්බර් මස 22 වෙනි දින හා අංක 313 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධි විධාන හා කොන්දේසි යටතේ මැටුප් අත්තිකාරමක් ගෙවිය හැක.

02. මෙම අත්තිකාරම සඳහා නියමිත ආකෘති පත්‍රයේ සකස් කළ අයදුම්පත් 1987.11.30 දින හෝ ඊට පුථම දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබෙන සේ එවිය යුතුය. 1984.01.19 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 237 ට අමුණා තිබූ ආදර්ශ අයදුම් පත්‍රය මේ සඳහා යොදා ගත යුතුය.

අත්.කලේ/ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

(එඩිගා ප්‍රනාන්දු)
ආයතන අධ්‍යක්ෂ.